# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 16 දරන පුරවැසිභාවය පිළිබඳ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 අප්‍රේල් මස 1 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 අප්‍රේල් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 8.25 යි.

තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 16 දරන පුරවැසිභාවය පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 අප්‍රේල් මස 1 වන දින]

එල්. ඩී.–ඕ. 11/2002.

**පුරවැසිභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2003 අංක 16 දරන පුරවැසිභාවය පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරවැසිභාවය පිළිබඳ පනතේ 2 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — 349 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) ඉහත සඳහන් තත්ත්වය දරන සෑම තැනැත්තෙක් ම මෙහි මින් මතු "ශ්‍රී ලංකාවේ පුරවැසියකු" ලෙස හඳුන්වනු ලැබේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඔහු උපන් අවස්ථාවේ දී ඔහුගේ පියා ලංකාවේ හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූයේ නම් ඔහුට පරම්පරාවෙන් පුරවැසිභාවය ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඔහු උපන් අවස්ථාවේ දී ඔහුගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු පුරවැසියකු වන්නේ නම් හෝ වූයේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඔහු උපන් අවස්ථාවේ දී ඔහුගේ පියා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් හෝ වූයේ නම්" යන වචන වෙනුවට "ඔහු උපන් අවස්ථාවේ දී ඔහුගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු පුරවැසියකු වන්නේ නම් හෝ වූයේ නම්" යන වචන ආදේශ කිරීමෙන්.

4\. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය මේ ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :–

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 5අ වගන්තිය ඇතුළත් කිරීම.

"මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුව උපන් තැනැත්තන්ගේ සුදුසුකම්.

5අ. (1) නියමිත දිනයට පසුව එහෙත් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත උපන්නා වූ ද-

(අ) තමා උපන් අවස්ථාවේ දී තම මව පමණක් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ සහ තම වයස අවුරුදු විසිදෙකක් ඉක්ම වූ ද යම් තැනැත්තෙක් ; හෝ

(ආ) තමා උපන් අවස්ථාවේ දී තම දෙමව්පියන්ගෙන් එක් අයකුවත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවූ එහෙත් තම දෙමව්පියන්ගෙන් එක් අයකු පසුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ද යම් තැනැත්තෙක්,

මේ වගන්තියේ පසුව එළඹෙන විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීමට සුදුස්සකු වන්නේ ය.

(2) වෙනත් යම් රටක පුරවැසියකු වූ ද ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීමට සහ එකී වෙනත් රටෙහි පුරවැසිභාවය අත්හැරීමට කැමැත්තක් දක්වන්නා වූ ද (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙක් විසින් එකී වෙනත් රටෙහි තත්කාර්ය සඳහා බලපවත්නා නීතියට අනුකූලව එම වෙනත් රටේ ස්වකීය පුරවැසිභාවය එම තැනැත්තා විසින් අත්හරින්නේ නම් සහ එම තැනැත්තා ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින්නේ නම් සහ ඔහු සාමාන්‍යයෙන් දිගටම ශ්‍රී ලංකාවේ පදිංචිව සිටීමට අදහස් කරන්නේ නම්, තමා ශ්‍රී ලංකාවෙහි පුරවැසිභාවය ලබාගත් බවට වූ ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ඔහු විසින් අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර එම ඉල්ලීම කරනු ලබන්නේ යම් ප්‍රකාශයක් සඳහා ද අමාත්‍යවරයා විසින් ඒ ප්‍රකාශය කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් රටක පුරවැසියකු වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ගැනීමට සහ එකී වෙනත් යම් රටේ තම පුරවැසිභාවය තමා වෙත තබාගැනීමට කැමැත්තක් දක්වන්නා වූ ද (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින්, තමා එකී වෙනත් යම් රටෙහි පුරවැසියකු වන බව සහ එසේ දිගටම පුරවැසියකු වශයෙන් සිටින බව නොතකා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙහි පුරවැසිභාවය ලබාගත් බවට වූ ප්‍රකාශයක් ලබාගැනීම සඳහා අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කළ හැකි අතර, ඒ ප්‍රකාශය කිරීම විෂයය සම්බන්ධයෙන් සියලු අවස්ථානුගත කරුණු අනුව ශ්‍රී ලංකාවේ යහපත සඳහා වන බවට සෑහීමට පත්වුවහොත් ඉල්ලීම කරනු ලැබුවේ යම් ප්‍රකාශයක් සඳහා ද ඒ ප්‍රකාශය අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙහි පුරවැසිභාවය ලබාගැනීම බලාත්මක වන දිනය, අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) 19 වන වගන්තියේ (7) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාගත් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) ගාස්තු ගෙවීමට අදාළව ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 6අ වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

"ඉල්ලීමක් ඉදිරිපත් කළ විට පුරවැසිභාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීම.

6ඇ. (1) 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් තැනැත්තකු ඔහු කැමතිනම් පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබාගැනීම සඳහා ආගමන හා විගමන පාලකවරයා වෙත ඉල්ලුම් කළ හැකි ය. ඒ ඉල්ලීම මෙහි "ඇ" උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය.

(2) පාලකවරයා ඉල්ලුම්කරුගේ තත්ත්වය පිළිබඳව සෑහීමට පත් වීමෙන් පසු ඉල්ලීම ලැබී දින හැටක් ඇතුළත මෙහි "ආ" උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල වූ සහතිකයක් පාලකවරයා විසින් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) එම සහතිකය බාලවයස්කාර ළමයකුට අදාළව නිකුත් කිරීමට ඇති අවස්ථාවක, ඒ සඳහා ඇති ඉල්ලීම ඒ බාලවයස්කාර ළමයා වෙනුවෙන් ඒ බාලවයස්කාර ළමයාගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) කිසිම තැනැත්තකු විසින් යම් කාර්යයක් සඳහා (2) වන උපවගන්තියේ දක්වා ඇති සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතු අතර, දිවුරුම් ප්‍රකාශයක් එම සහතිකයේ සඳහන් කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ඉවත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "පියා" හෝ "පියාගේ" යන වචන යෙදී ඇති සෑම ස්ථානයක දී ම ඒ වචන වෙනුවට පිළිවෙලින් "පියා හෝ මව" හෝ "පියාගේ හෝ මවගේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි (I) වන අනුඡේදය ඉවත් කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි (ii) වන අනුඡේදයෙහි "ස්වකීය පියා පුරවැසියකු වූ" යන වචන වෙනුවට "ස්වකීය දෙමව්පියන්ගෙන් එක් අයකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි (iii) අනුඡේදයෙහි "ඔහුගේ පියා පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වූයේ නම්" යන වචන වෙනුවට "ඔහුගේ දෙමව්පියන්ගෙන් එක් අයකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූයේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය ඉවත් කිරීමෙන්.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "බාලවයස්කාර ළමයා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "අවුරුදු විසි එකක්" යන වචන වෙනුවට "අවුරුදු දහඅටක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "අවුරුදු විසි එකක්" යන වචන වෙනුවට "අවුරුදු දහඅටක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛන එකතු කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :–

" "අ" උපලේඛනය (6අ වගන්තිය)

(349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ 6අ වගන්තිය යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් සඳහා වූ ඉල්ලීම.

1. පනතේ 6අ වගන්තිය ප්‍රකාරව...................... වන මම ඉල්ලුම්කරු වශයෙන්*/ ....................යන බාලවයස්කාර ළමයාගේ දෙමව්පියකු වශයෙන්* මගේ* / ඉහත සඳහන් මගේ ළමයාගේ* පුරවැසිභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

2. මා*/ඉහත සඳහන් මගේ ළමයා* පනතේ 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන බව මෙයින් ප්‍රකාශ කරමි.

3. මම*/ඉහත සඳහන් මගේ ළමයාට* අදාළ විස්තර පහත සඳහන් කරමි :

(අ) සම්පූර්ණ නම: ...........................................

(ආ) ලිපිනය: ..................................................

(ඇ) ස්ත්‍රීපුරුෂ භාවය : පුරුෂ /ස්ත්‍රී

(ඈ) උපන් දිනය: ..............................................

(ඉ) උපන් ස්ථානය: ...........................................

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත උපන්නේ නම් උපත ලියාපදිංචි කළ ස්ථානය–

..........................................

(උ) දෙමව්පියන්ගේ විස්තර:

| පියා | මව |
| --- | --- |
| නම | නම |
| ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග: | ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග: |
| ජා. හැ. ප. අංකය (තිබේනම්) | ජා. හැ. ප. අංකය (තිබේ නම්) |
| පදිංචි ලිපිනය :– | පදිංචි ලිපිනය :– |
| .................................... | .................................... |

අදාළ නොවන කොටස් කපා හරින්න.

## ප්‍රකාශනය

4. මම/ ඉහත නම් සඳහන් මගේ ළමයා වෙනත් යම් රටක පුරවැසියකු නොවන බව ප්‍රකාශ කරමි.

මගේ දැනුම අනුව ඉහත සඳහන් විස්තර සත්‍ය බවට ගෞරව බහුමානයෙන් යුක්තව ද අවංකව ද, සත්‍යලෙස ද ප්‍රකාශ කර දිවුරා සිටිමි./ප්‍රතිඥා දෙමි.

.............................

ඉල්ලුම්කරුගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.

දිනය :-

.................................මස
.................................දින.
මා ඉදිරිපිටදී ප්‍රතිඥා දෙන ලදී/
දිවුරුම් දෙන ලදී.

.............................

සමාදාන විනිශ්චයකාර තැනගේ/
දිවුරුම් කොමසාරිස්ගේ අත්සන.

සමාදාන විනිශ්චයකරුගේ
හෝ දිවුරුම් කොමසාරිස්ගේ
නම සහ ලිපිනය
.....................................

.....................................

.....................................

"ආ" උපලේඛනය (6අ වගන්තිය)

(349 වන අධිකාරය වූ) පුරවැසිභාවය පිළිබඳ පනතේ 6අ වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය පිළිබඳ සහතිකය

පනතේ 6අ වගන්තියේ විධිවිධානවලින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ආගමන හා විගමන පාලක...................................................වන මම
(ලිපිනය)
පදිංචි...........................................නමැති අය පනතේ 5 වන වගන්තියේ
(නම)
විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට මෙයින් සහතික කරමි.

### පුරවැසියාට අදාළ තොරතුරු

නම:...........................................................................
පුරවැසියකු වන/පුරවැසියන් වන දෙමව්පියන්ගේ නම්:

(1) ...........................................................................

(2) ...........................................................................

උපන් දිනය හා ස්ථානය :...............................................
ස්ත්‍රීපුරුෂ භාවය:.........................................................
හැඳුනුම්පත් අංකය (ඇත්නම්):.........................................

දිනය: ආගමන විගමන පාලක."

ලියාපදිංචියෙන් පුරවැසිභාවය ලබාගත් තැනැත්තන් පරම්පරාවෙන් පුරවැසිභාවය ලබාගත් තැනැත්තන් ලෙස සැලකිය යුතු බව.

**14.** මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු, මේ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට කරන ලද සංශෝධන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පරම්පරාවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ගන්නා අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට බලපවත්වන පරිදි, ඒ තැනැත්තා පරම්පරාවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.